# උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## ஊவா மாகாண கல்வித் திணைக்களம்
## Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -පෙරහුරු පරීක්ෂණය 2026
**General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026**

| 13 ශ්‍රේණිය | 71 | S | I | සිංහල භාෂාව හා සාහිත්‍ය I<br>Sinhala Language I | කාලය : පැය තුනයි.<br>Time : Three hours |
|---|---|---|---|---|---|

- **අමතර කියවීම් කාලය මිනිත්තු 10කි. එය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස්
- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** හා **(උ)** උද්ධෘත අතරින් **සතරක්** තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** හා **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න.

( මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) ඒ අසා දේවතාවාණෝ ‘මේ තැනට අවුත් මා මෙතෙක් කථා කොටත් බමුණාණෝ තුනුරුවන්හි පැහැද පින් කොට නොහොත් නම්, කළ පිට වට වැස්සෙන් කළය ඇතුළට ප්‍රයෝජන නැත්තා සේ මාගේ කථාවෙනුත් ප්‍රයෝජන නැත. මේ කරන කථාවෙන් මුන් ඇතුළු වූ සියල්ලන් සිත පහදවා ගත් පමණකින් දෙව්ලොව සැපත් සිද්ධ කරන ලෙසට කියමි’ සිතා බමුණාණෙනි, තොප කීවා සේ වැඩිමාලු ව සිටි තොපගෙන් ඒ ලෙස විධානයකුත් නැති හෙයින් දානාදී වූ සෙසු පින්කමක් කට නුහුණුම්හ.එතකුදු වුවත් අහේතුක ප්‍රතිසන්ධික වූ බකමූණන් පවා සර්වඥ ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ කෙරෙහි සිත් පහදවා ගත් පමණකින් කප් ලක්ෂයක් දුගතියට නො ගොස් කෙළවර සෝමනස්ස නම් පසේ බුදුවන කල ඒ චිත්ත ප්‍රසාදය අපට කැල ම පිහිටවන්නේ වේ දැයි මියන අන්තයෙහි පිළ හොත්තා වූ මම බොහෝ දෙනාට දෙන දෙයක් තෝරා ලා එක් කෙනකුන්ට ම දෙවන කලක් පරිද්දෙන් මා ම කෙරෙහි කළ කරුණාවෙන් එතැනට වැඩි බුදුන් දැක ඉඳුරා සිතත් ඇති කෙනෙකුන් දැක නොපහදින්නට බැරි හෙයින් සිත ඉඳුරා පහදවා චිත්ත ප්‍රසාද නැමැති හිනින් දෙව්ලොවට නැංගෙමි'යි කිවු ය.

(i) මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා සඳහන් කරන පරිදි තමන්ට කුසලයක් කර ගැනීමට නොහැකි වූ කාරණය කුමක්ද ?

(ii) අහේතුක ප්‍රතිසන්ධික වූ බකමූණන් පවා බුදුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයා කෙරෙහි සිත් පහදවා ගැනීමෙන් ලද ආනිසංශය කුමක්ද ?

(iii) “සිත ඉඳුරා පහදවා චිත්ත ප්‍රසාද නමැති හිනින් දෙව්ලොවට නැංගෙමි”.මෙය ලිහිල් බසින් ලියන්න

(iv) ‘අහේතුක ප්‍රතිසන්ධික’ යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 01 × 04 = 04 යි.)

(ආ) එතැන් පටන් ජීවකයෝ තමන් වූ පවත් දැන මගේ කිසි ම නෑසිය කෙනෙකුත් නැත. මතු මට හිමි වන කුල සැපතකුදු නැත. එසේ හෙයින් මා විසින් ශිල්පයන් හදාරා ගත මැනව. ශිල්ප බලයෙන් බොහෝ දෙනා නෑ කොට ගෙන ධන උපයා ගත මැනව.කෙසේ වූ ශිල්පයක් හදාරම් දෝ හෝ යි නිරවද්‍ය වූ ශිල්ප පරීක්ෂා කරන්නාහු අෂ්ටාදශ ශිල්ප හා සූසැට කලා ශිල්පයෙන් සෙසු ශිල්ප පරපීඩා,පරහිංසා මිශ්‍ර ය.වෛද්‍ය ශිල්පය හදාරා ගතිම් නම් වෛද්‍යාචාර්ය යන නම් ඇසූ කල සත්ත්වයෝ මවුන් පියන් ගුරුන් කොට ම සිතා ඔවුන් කෙරෙහි ප්‍රිය ඇතිවන්නාහු ය,වෛද්‍ය ශාස්ත්‍රය නම් දතුවාහට මෙලොවත් වැඩ වෙයි. පරලොවත් වැඩ වෙයි. පින්සිදු වෙයි. එසේ හෙයින් වෛද්‍ය ශාස්ත්‍රය ම උගනිම් සිතා තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් දැක තමන් ආ පවත් කියා සිටියාහ. ආචාරීන් තෙපි කවුරුදැයි විචාළ කල අනිකක් කීම් නම් මා කෙරෙහි ආදර නොකරති සිතා රජගහ නුවර බිම්බිසාර රජ්ජුරුවන්ගේ මුනුබුරාණෙමි. අභය නම්

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

රාජ කුමාරයන් පුතණුයෙමි කීහ.“කුමන ශාස්ත්‍රයක් උගනුදැ”යි විචාළහ.වෛද්‍ය ශාස්ත්‍රය උගනිමියි කීහ.ආචාරීහු ආචාරීභාගය ගෙනාවුදැ'යි විචාළහ. දෙමාපියන්ට නොකියා ශිල්ප ලෝභයෙන් සොරා ආයිමි.

එසේ හෙයින් ආචාරීභාගය නොගෙනායෙමි.නුඹවහන්සේට මෙහෙකොට ධර්මාන්තේවාසිකව ශිල්ප හදාරමි යි කීහ.එකල ආචාරී මෙතෙම පින්වත් පුරුෂයෙකැයි සිතා ශුභ මොහොතකින් වෛද්‍යයට පටන් ගැන්වූහ.

(i) ජීවක තමන් විසින් ශිල්පයක් හදාරා ගත යුතුයැයි සිතුවේ ඇයි?

(ii) වෛද්‍ය ශිල්පය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන කීයක් මෙහි සඳහන් වේද?

(iii) **අෂ්ටාදශ ශිල්ප හා සූසැට කලා ශිල්පයෙන් සෙසු ශිල්ප පරපීඩා පරහිංසා මිශ්‍රය** යන වැකිය ලිහිල් බසින් ලියන්න.

(iv) “ආචාරි භාගය” යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 01 × 04 = 04 යි.)

(ඉ) එකල්හි උතුම් ගුණ ඇති පතිවත් වූ ඇගේ සෝකාග්නි වේගය සුවාසූදහසක් යොදුන් උඩ නැගී සක්දෙව් රජුගේ භවනය හුණු කෙළේ ය.ශක්‍ර දේවේන්ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණු වෙසක් ගෙන ඇසිල්ලකින් අවුත් මහා බෝසතාණන් ඔත් ගල් මුදුනෙහි පෙනී කෙණ්ඩිකාවෙන් පැන් ගෙන මහ බෝසතාණන් ඇඟ ඉසළුහ. එකෙනෙහි විෂ නැසී වණය සුව ව කොතන විදි බවත් නොදත හැකි විය. මහ බෝසත් එවිට අනුන් වෙහෙසෙන්නට මළ වෙස්ලා වැදහොත් එකෙකු පරිද්දෙන් වහා සුවපත් වූයේ ය.චන්ද්‍රිකාවද එ සඳ සුවපත්ව සිටි ප්‍රිය ස්වාමි දැක බලවත් වූ සොම්නසට පැමිණ,“ස්වාමීනි, යම් බඳු නුඹ වහන්සේ මාගේ ප්‍රිය කල් වූ ඇඟ අමා පැන් ඉස නිදුක්කොට මාගේ ඒ කළ කම් දුරුකොට ප්‍රිය වූ අප දෙදෙනා සමඟ කළ සේක්ද එසේ නුඹ වහන්සේගේ ශ්‍රී පාදය වඳිමි” වැඳහොත්තීය.ඒ ශක්‍ර දේවේන්ද්‍රයෝ ද උන් දැක බලවත් වූ සොම්නසට පැමිණ “මෙතැන්හි නොවසව, පර්වතයෙන් බැස මිනිසුන්ට අවිසය තැන වෙසෙත්ව”යි අවවාද කොට තමන්ගේ දිව්‍ය ලෝකයට ගියාහ.

(i) ශෝක වූ කිඳුරිය වෙනුවෙන් සක් දෙවිඳුන් විසින් ගන්නා ලද්දේ කිනම් ක්‍රියාමාර්ගයක් ද?

(ii) මහ බෝසතාණන්ගේ සිරුරට පැන් ඉසී විට ඇති වූ වෙනස කුමක්ද?

(iii) **‘ඇගේ ශෝකාග්නි වේගය සුවාසූ දහසක් යොදුන් උඩ නැඟී සක් දෙව් රජහුගේ භවනය හුණු කළේය’**මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) ‘එකෙණෙහි’යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 01 × 04 = 04 යි.)

**(ඊ)** මෙසේ නික්මුනා වූ ඒ චණ්ඩාල බ්‍රාහ්මණතෙම අතරමග එක් නුවරෙක රජ්ජුරු කෙනෙකුන් දැක වීණා ගායනා කරනුයේ ස්වර්ණතිලකාව තමා පිටුපස හිඳිනා සේ සලස්වා තෙමේ වීණා ගායනා කරන්නට පටන් ගත.එකල්හි ඔහු පිටුපස හුන්නාවූ ස්වර්ණතිලකා තොමෝ නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙලා ස්වකීය වූ ස්ත්‍රී ලීලාවෙන් යුක්තව මදලස බැල්මෙන් රජහු මුහුණ බලා තමා පෙරව හුන් පලස මදක් පහ කොට ශරීර ප්‍රභා දක්වාලුව.රජ්ජුරුවෝ ඇගේ ශරීරාලෝක හා රූපසම්පත්තිය දැක කාමයෙන් විසංඥව සිහිමුළාව ඇසිල්ලකින් ලබන ලද ආස්වාද ඇති ව මෝතමෝ සස්වාමික ද අස්වාමිකදැ'යි විචාරා අස්වාමිකය, එතකුදු වුවත් සැඩොල් දුවකැ යි අසා අන්තඃපුරයට ගත නො හී මෙ බඳු වූ වර්ණසෞන්දර්යයක් හා රූප සම්පත්තියකින් යුක්තවූ ස්ත්‍රීරත්නයක් නොලබන්නා වූ මට ජීවිතයෙන් ප්‍රයෝජන කිම්දැයි ශෝකාතුරව නොයෙක් ප්‍රලාප කියා හඬමින් කාමයෙන් මත් ව කටයුතු නොකටයුතු සලකා ගත නො හී කඩුව ගෙන තමන් හිස තුමූ ම කපා මළහ .

(i) චණ්ඩාල බ්‍රාහ්මණයා වීණා ගායනා කරන මොහොතේ,ඔහුට පිටුපසින් සිටි ස්වර්ණතිලකා හැසිරුණේ කෙසේ ද?

(ii) රජුට ස්වර්ණතිලකාව අන්තඃපුරයට ගැනීමට නොහැකි වූ කාරණාව කුමක් ද?

(iii) ‘කාමයෙන් විසංඥව සිහිමුළාව මද ඇසිල්ලකින් ලබන ලද ආස්වාද ඇතිව මෝ තොමෝ සස්වාමික ද අස්වාමික දැයි විචාරා’ යන්න ලිහිල් බසින් ලියන්න.

(iv) ‘ප්‍රලාප’ යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 01 × 04 = 04 යි.)

(උ) නිරිඳු සඳ එබසට

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

| | |
|---|---|
| බෝසත්හු මුව | තඹරට |
| සිය නෙත් බිඟු | විහිට |
| එසඳ පැවසී තෙපුල් | මෙලෙසට |

| | |
|---|---|
| නොබා | අපවාදය |
| කෙරෙමි'යි කියයි | වාදය |
| සොඳේ තොප | පැදය |
| ඉගැන්නු විලස වෙණ | වාදය |

(i) පළමු කවියෙන් ඉස්මතු වන කාව්‍යාලංකාරය කුමක්ද?

(ii) මෙහි සඳහන් රජු බෝසතුන්ට කුමක් ප්‍රකාශ කළේ ද?

(iii) 'බෝසත්හු මුව තඹරට
සියනෙත් බිඟු විහිට' යන්න ලිහිල් බසින් ලියන්න.

(iv) "තෙපුල්" යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 01 × 04 = 04 යි.)

- **(ඌ)** සහ **(ඒ)** ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

**(ඌ)** පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "මෙබඳු ස්ත්‍රීරත්නයෙකින් වියෝව ජීවත්වීමට වඩා මිය යාම යහපතැ'යි

(ii) "ඇයි ස්වාමීන පුත්‍රයාණනි, මා ඇර පියා නික්මුණු නියා දැ"?

(iii) "අපි උපයන අවස්ථාවේ මෙසේ සියුම්ව උපයන සේක් දනුම් හ"

(iv) "පින්වත,මහණ ගොයුම්හු පවරාගෙන වුත්, දන් වළඳවාලා ප්‍රශ්න විචාරමි"

(v) "ඔය අදහසට නං මට කොහොමවත් කැමති වෙන්න බැහැ"

(vi) "යා නොහැකිය බියකුත් ඇත මා සිත තුළ"

(vii) "උඹ මොකටද මේ වෙලාවේ ආවේ හෙට වරෙන්"

(ලකුණු 03× 04 = 12 යි.)

( ඒ) ජීවන දෘෂ්ටිය හා කාව්‍ය භාෂාව කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පංතිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

නොවැලපෙමි ඔබ යන්න - වැලප ඇති පල කිම් ද?
ජීවිතයේ වැරදුනේ මෙතැන විතරක් නො වේ
සුරලා ගෙන යන්න මා හදේ පිපුණ මල්
මල් නහන වසන්තය ඔබට ගෙන යා හැකි ද?

නොවැලපෙමි ඔබ යන්න - වැලප ඇති පල කිම් ද?
ඔබේ නම අදින් පසු තවත් මට අයිති නැ
ඔබ නැත ද ජීවිතේ නසා ගත නොහැක මට
ඔබ යන්න ජීවිතේ සොයාගෙන සොයාගෙන

ඔබ යන්න මධුරතර සප්ත ස්වරයන් අරන්
ඔබේ රථ මැදිරියට මගේ ඉර - හඳ අරන්
ඔබ යන්න මහදනෙත් වැහි වලාකුළ අරන්
කමක් නෑ ඔබ යන්න මගේ ආයුෂ අරන්

වෙස්මුහුණ පැළඳගෙන සිටින තැන හිතක් නැත
ගෙවදින්න ඇති නිසා හෙට අලුත් විමානෙට
පෙම් ගී අලංකාර විසිකොට යනු මැනවි
නිල් නුවන් ගැබ වඩින කුරුල්ලකු පරිද්දෙන්
ඔබ ඔබේ සිහිනයට - මම මගේ ලෝකයට

හෙමෙන් මා අත අතැර - දෙපස හෙවණැලි අතර
ඔබ සෙමෙන් හැංගුණේ, එය වඩා විනීත යි
එදා ඔබ ගෙයි මුල්ලේ - සොයාගත් මං දිනුම්
ඔබ සැඟව ගියේ කොයි ද - සොයන්නේ නෑ ඉතින්
ජය පරාජය කවුද - මට එයින් පලක් නැත

ආදරය නින්දක් ද - පිබිදිලා සිටින මට
දිනෙන් දින මගේ නෙත් පැහැදුල් ය, සුවිපුල් ය
නින්ද තුළ නැති වුණේ එක දෙය යි - වරදක් ද
තව බොහෝ දේ තිබේ - ජීවිතේ ජය ගනිමි.

(ලකුණු 12 යි.

**2.** පුද්ගල සන්තානගත සිතුවිලිවල පවත්නා සංකීර්ණත්වය ප්‍රබල අයුරින් විශද කිරීමට සද්ධර්මරත්නාවලි කතුවරයා දැක්වූ දක්ෂතාවය නිර්දිෂ්ට කතා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

'අවස්ථානුකූලව ගන්නා තීන්දු තීරණය පුද්ගලයාගේ යහපතටත් පුද්ගලයාගේ අයහපතටත් ප්‍රබලව බලපාන හේතු කාරකයන් වේ'.නිර්දිෂ්ට කතා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 15 යි.)

**3.** "සමකාලීන සමාජ තතු විනිවිද ව පෙන්වාදීමට පූජාවලී කතුවරයා ඉමහත් ප්‍රයත්නයක් දරා ඇත." නිර්දිෂ්ට කතා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

"වෘතාන්ත ශෛලියෙන් තමන්ම නාට්‍යානුසාරී බවින් යුතුව කතා පුවත විකාශනය කර ඇති නිසාම සද්ධර්මාලංකාරය පාඨක ආකර්ෂණය ඉහළින් ම දිනා ගනියි". නිර්දිෂ්ට කතා වස්තු ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

**4.** ස්වකීය ප්‍රතිභාපූර්ණ කවිත්වය නිසා ම අදාළ අවස්ථාව පාඨක මනසේ සජීවී සිතුවමක් ලෙසින් චිත්‍රණය කරන්නට ගුත්තිල කතුවරයා දැක්වූ දක්ෂතාව උදේනිපුර සැණකෙළි වැනුම තුළින් පහදන්න.

(ලකුණු 15 යි.)

**5.** ඇතැම් පාලකයන්ගේ අත්තනෝමතික ක්‍රියා නිසා පීඩා විඳින නිර්ධන පාන්තික සමාජ යථාර්ථය අව්‍යාජ ව ප්‍රතිනිර්මාණය කරන්නට බැද්දේගම කතුවරයා විසින් ගන්නා ලද ප්‍රයත්නය ඇගැයීමට ලක් කරන්න.

(ලකුණු 15 යි.)

**6.** කෙටි කතාවක "යථාර්ථ නිරූපණය" යනු කුමක්දැයි පැහැදිලි කොට එය **"ගස් "** කෙටි කතාව තුළින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

**7.** කවියා සතු පෞද්ගලික අත්දැකීම් සමස්ත සමාජයේම පොදු අත්දැකීමක් බවට පත්කර අපූරු ජීවන දර්ශනයක් තිළිණ කරන්නට කවියා විසින් ගනු ලැබූ උත්සාහය නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

**8.** ප්‍රබල නාට්‍යෝචිත අවස්ථා රැසක්ම විද්‍යාමාන වන අයුරින් පෙළගස්වා තිබීම නිසා ම ජේමතෝ ජායති සෝකෝ නාට්‍යය සහෘද ආකර්ෂණය ඉහළින්ම දිනාගෙන ඇත. පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

| 13 ශ්‍රේණිය | 71 | S | II | සිංහල භාෂාව හා සාහිත්‍ය II / Sinhala Language II | කාලය : පැය තුනයි. / Time : Three hours |
|---|---|---|---|---|---|

- අමතර කියවීම් කාලය මිනිත්තු 10කි. එය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස්
- I කොටසේ I ප්‍රශ්නයද II කොටසේ 2,3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න <u>පහකට</u> පිළිතුරු සපයන්න.
- II කොටසේ ඇති සියලුම අනු කොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරු පත් සමග අමුණා බාර දෙන්න.

## I කොටස

**01.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට **හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 පළමු හා දෙවන අක්ෂර ඕෂ්ඨජ අක්ෂර පමණක් අන්තර්ගත වචන සහිත වරණය තෝරන්න.

(1) පඹයා, කුදිටු, බලය, සතුරා, මතක
(2) උපමා, පබඳ, උපදෙස්, පබල, බමන
(3) භයානක, සබඳ, දහම, මතක, කමත
(4) බමර, උමග, ගමන, සකුණ, පමණ
(5) විපුල, සිරස, තඹර, වසභ, යතුර (......)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න

(1) විමර්සණය, වීරෝදාර, ස්වභාවික, ළෙන්ගතු, පළතුරු
(2) විමර්සනය, වීරෝධාර, ස්වාභාවික, ලෙන්ගතු, පළතුරු
(3) විමර්ශණය, වීරෝදාර, ස්වභාවක, ළෙන්ගතු, පලතුරු
(4) විමර්ශනය,වීරෝදාර, ස්වාභාවික, ළෙන්ගතු, පලතුරු
(5) විමර්ෂණය, වීරෝධාර, ස්වභාවික, ලෙන්ගතු, පළතුරු (......)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) කෘෂ, කෝප, කුදිටු, කෛරාටික, කෞතුක
(2) කෞතුක, කෝප, කෘෂ, කුදිටු, කෛරාටික
(3) කුදිටු, කෘෂ, කෛරාටික, කෝප, කෞතුක
(4) කෛරාටික, කුදිටු, කෝප, කෘෂ, කෞතුක
(5) කෝප, කෛරාටික, කුදිටු, කෘෂ, කෞතුක (......)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතරින් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

ඌෂ්මාක්ෂර යනු,

(1) උගුරෙන් උපදින අක්ෂරයි.
(2) ඌෂ්මාක්ෂර සංඛ්‍යාත්මක ව 10 ක් ඇත.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(3) ඌෂ්මාක්ෂරවලින් පටන් ගන්නා වචන නැත.
(4) උච්චාරණයේදී උණුසුම් වායු ධාරාවක් නිකුත් නොකරයි.
(5) සර්ෂ නමින් ද හඳුන්වයි. (......)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) විදෙස් ප්‍රවෘත්ති, රෞද්‍ර රකුසා, මාර්ග අනතුරු, බොදු ප්‍රතිපත්ති
(2) වෘක්ෂ දේවතාවා, මධ්‍යම ප්‍රතිපදාව, ස්ථිර අධිෂ්ඨානය, මෘගරාජ
(3) අග සව්, ජ්‍යෙෂ්ඨ පුත්, දෙස් අබිමන්, අටසිල්
(4) විමර්ශන ඇස, තිරසර, නීල නුවන්, ප්‍රඥා සාර
(5) ජාතිභේද, ආකාශ ගඟ, ක්‍රීඩා නාටක, දෙව්රජ (......)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) පටිපාටි, මනඃකල්පිත, නර, තිමිර
(2) සලකුණු, ක්‍රීඩා, පිළිතුරු, ගද්‍ය
(3) ඇස, බිය, දැය, පුත්‍ර
(4) ලේඛන, දෙරණ, පණ, නුවණ
(5) ශීර්ෂය, කිරුළු, මිත්‍ර, බොජුන් (......)

1.7 තද්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) දෝෂ, මැදුර, රශ්මි, පුත්‍ර
(2) කතු, සිතු, මිතු, දුහිතෘ
(3) වෙණ, භය, ධර්ම, දසුන
(4) දහම, සිරුර, පච්ච, වෙහෙර
(5) මිත්‍ර, කෘෂ, වීර්යය, ස්ථාන (......)

1.8 විශේෂණ, විභක්ති, අන්‍යාර්ථ, අව්‍ය සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) අටසිල්, උපනායක, බුදු බණ, දසබල
(2) බුදු බණ, අටසිල්, දසබල, උපනායක
(3) උපනායක, බුදුබණ, දසබල, අටසිල්
(4) දසබල, උපනායක, අටසිල්, බුදු බණ
(5) අටසිල්, බුදුබණ, දසබල, උපනායක (......)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වන වරණය තෝරන්න.

(1) වදාළ, මළ, කකාළ, වගුළ
(2) සොයන, සරන, කිරණ, විමසන
(3) ගෙරවුම්, කැවුම්, ගොඩනැගිලි, පැවරුම්
(4) සෙවූ, කැඩූ, වැපිරූ, වැගිරූ
(5) දේශිත, යෝජිත, පූරිත, නින්දිත (......)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ). **කියග** මගිය, එනු කොයි සිට

(ආ). **දකුතු** රඟන සුරඟන රඟලාගේ

(ඉ ). දණ ගාද්දි **ඇවිදින්න**ට මට අත දුන්න.

(ඊ ). එක පුටුවක **වාඩිවෙලා** එක පැන්සල දෙකට කඩා

(1) අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා
(2) අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධික්‍රියා
(3) පූර්ව ක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා
(4) අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, විධික්‍රියා, පූර්ව ක්‍රියා
(5) විධික්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා (......)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න

(1) ශිෂ්‍යත්ව, ව්‍යාකුලත්ව, පරාධීනත්ව, සංකීර්ණත්ව
(2) දක්ෂතම, ප්‍රියතම, ශ්‍රේෂ්ඨතම, මිහිරිතම
(3) ගැමි, සැබි, නැවි, දැවි
(4) ප්‍රාථමික, දෛනික, නෛතික, වෛදික
(5) වාසනාවන්ත, සෙනෙහෙවන්ත, කරුණාවන්ත, ආදරවන්ත (......)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න

(1) කුමුදු, කුරුලු, කුදිටු, කුමරු
(2) සබඳ, සවල, සසඳ, සහය
(3) නිරුත්තර, නිදහස්, නිසදැස්, නිවහල්
(4) අවමංගල්‍යය, අවසර, අවවාද, අවමාන
(5) දුගඳ, දුසිරිත්, දුකඳුරු, දුෂ්කර (......)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වචනය තෝරන්න.

(1) මෙන්, සේ, බඳු, වැනි
(2) නිරතුරු, පුන, වැලි, නැවත
(3) ඇයි, කෙසේ ද, කවද ද, මොනවද
(4) හෙවත්, නොහොත්, වූ කලී, සඳහා
(5) අද, හෙට, නැවත, අරභයා (......)

1.14 දිවා **සුරකුම් මධ්‍යස්ථානයේ** අවට පරිසරය නානාවිධ **සියපත්** වලින් සුසැදි පුෂ්කරණීන්ගෙන් සැදුම් ලද්දේය.

ඉහත පාඨයේ වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සමාස, විභක්ති, කෘදන්ත
(2) විභක්ති, සමාස, කෘදන්ත
(3) කෘදන්ත, සමාස, විභක්ති
(4) කෘදන්ත, විභක්ති, සමාස
(5) විභක්ති, කෘදන්ත, සමාස (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) අතුළ, වදාළ, හදාළ, බිඩාළ
(2) සිතනු, විමසන්න, සොයත, ගයව්
(3) සොයන්නීය, රකින්නීය, සිතන්නාය, විමසන්නිය
(4) බලවයි, ලියවයි, රවයි, අඬවයි
(5) ගත්තෙහි, විමසහු, ගියෙහි, ඇසුවෙහු (......)

1.16 සමාසයක් නොවන පදයක් අන්තර්ගත වර්ණය කුමක් ද?

PAST PAPERS WIKI
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(1) සුන්තුරු, බටහිර, දසබල, තිනෙත්
(2) නවදොර, දසපාරමිතා, දසබල, තිනෙත්
(3) අකුසල්, අනුපමේය, අපැහැදිලි, අනෞචිත්‍ය
(4) ඉබිගමන, කුරුලු පිහාටු, ළමා මේසය, දසබල
(5) නළු නිළ, ගව මහීෂ, ඉඩකඩ, මද නල (......)

1.17 එකම වර්ගයට අයත් **සන්ධි** පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) නිරුදක, මහියංගන, සුරත, වියවුල
(2) එකිනෙක, මලසුන, සිහිනිහ, දකුණැස
(3) දයානුකම්පා, පරමේශ්වර, දෑල, ලග්ගල
(4) නෙතග, මලසුන, මුං කැවුම්, කොළොම්පුර
(5) ගුරුපහාර, කවීන්ද්‍ර, කුසලාකුසල, සින්ධූපමාන (......)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය තෝරන්න.

(1) අද, ඊයේ, හෙට, ඉක්බිති
(2) කෘත, වට, බට, මෘත
(3) ග්‍රාමීය, ගණිතඥ, ද්විතීය, විද්‍යාලයීය
(4) සුනිල්, සුගත්, සුරත්, සුපුන්
(5) අසත්, ගයත්, දෙනෙත්, නටත් (......)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍ය තෝරන්න.

(1) රණවිරුවන් වනාහි දැයට ජීවය දෙන්නෝ වෙති.
(2) රියැදුරෝ මාර්ග නීති පිළිපදිත්වා.
(3) කාර්යාලයේ ලිපිකරුවන් නැත.
(4) හෙතෙම විහාරස්ථානය ප්‍රතිසංස්කරණය කරති'යි ආණ්ඩුකාරතුමා සිතූහ.
(5) පාපතරයෝ සංසාරයේ බියකරු බව වටහා ගන්නේ කවදා ද? (......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

(1) අපි බොරුව වහං කෙරුවත් කිසිම වැඩක් නෑ.
(2) වංචනිකයෝ අප සතු දේපළ පැහැර ගත්හ.
(3) නංගි මායි අම්බලම ඉදිරියේ නැවතී සිටියා.
(4) නහින දෙහින කාලෙ ජීවිතය ගැන සැහැල්ලුවෙන් හිතන්න එපා.
(5) මං අවුරුද්දට පෙර ණයතුරුස් වලින් නිදහස් වුණා. (......)

(ලකුණු 01 × 20 = 20 යි)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources